www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time : 2 hours**


## GEOGRAPHY - I

## භූගෝල විද්‍යාව – I

Name :- ..................................................... Grade : -................ Index number:-....................

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ❖ **(ලකුණු 2 × 20 = 40 යි.)**

❖ අංක 01-05 දක්වා ප්‍රශ්නවලට දී ඇති ආදර්ශ ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




1. වර්ෂය පුරා කාලයෙන් කාලයට උෂ්ණත්වය අඩු වැඩි වීම නිසා ඍතු භේදය පවතී. එනම් පැහැදිලි උණුසුම් හා ශීත ඍතුවක් මෙම කලාපය තුළ පවතී. මෙම ලක්ෂණ සහිත දේශගුණික කලාපය දක්වා ඇති අක්ෂරය,

   (i) A (ii) B (iii) C (iv) D

2. E අක්ෂරයෙන් දක්වා ඇති රටවල්වල ජීවත් වන මානව වර්ගය,

   (i) කොකසොයිඩ් (ii) මොංගොලොයිඩ්

   (iii) නීග්‍රොයිඩ් (iv) ඔස්ට්‍රොලොයිඩ්

3. ලොව වඩාත්ම උසින් පිහිටි ටිබෙට් සානුව දක්වා ඇති අක්ෂරය,

   (i) F (ii) G (iii) H iv) J



agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

4. "K" අක්ෂරයෙන් දැක්වෙන ගංගාව හා එය ගලා බසින මුහුද පිළිවෙලින් දක්වා ඇති පිළිතුර,

    (i) යූරල් ගඟ හා කැස්පියන් මුහුද (ii) යූරල් ගඟ හා කළු මුහුද

    (iii) සර්ඩේරියා හා එරල් මුහුද (iv) ටයිග්‍රීස් ගඟ හා අරාබි මුහුද

5. ආසියාවේ කාර්මික රටක් ලෙස ප්‍රසිද්ධ "L" අක්ෂරයෙන් දක්වා ඇති රට,

    (i) ඩුබායි (ii) මැලේසියාව

    (iii) ජපානය (iv) පාකිස්ථානය

❖ අංක 06-10 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

6. ගංගා මෝය ප්‍රදේශ වැලි තැම්පත් වී ඇහිරීම නිසාත් ගංගා පිටාර ගැලීම හේතු කර ගෙන පහත් බිම්වල ජලය රැඳීම නිසාත් නිර්මාණය වන භූ ලක්ෂණය,

    (i) බොකු (ii) වගුරු බිම්

    (iii) කලපු (iv) දූපත්

7. සංවහන වර්ෂාවෙහි දැකිය නොහැකි ලක්ෂණයකි,

    (i) මෝසම් හා වාසුළි බලපෑම අවසන් වූ විට යලිත් ඉස්මතු වේ.

    (ii) වර්ෂාව සවස් කාලයේ දී ලැබේ.

    (iii) අසිනි වැසි, අකුණු කුණාටු ලෙස හැඳින්වේ.

    (iv) ජල වාෂ්ප සහිත සුළං මධ්‍යම කඳුකරයේ ගැටී ඉහළ ගොස් ලංකාවේ තිරිත ප්‍රදේශයට වර්ෂාව ලැබේ.

8. පහතරට තෙත් කලාපීය වනාන්තරවල දැකිය හැකි ශාකවර්ග පමණක් ඇතුළත් පිළිතුර,

    (i) හොර, කීන, නා, ගොඩපර (ii) තේක්ක, බුරුත, කළුවර, පලු

    (iii) බෙරලිය, මොර, කීන, හුලංහික් (iv) අරළු, බුළු, නෙල්ලි, දොඹ

9. ලංකාවේ අඩුම ජනව්‍යාප්තියක් සහිත පළාත වන්නේ,

    (i) නැගෙනහිර (ii) වයඹ

    (iii) ඌව (iv) උතුර



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

10. වැලිමඩ සානුව පිහිටා ඇත්තේ,

    (i) පිදුරුතලාගල හා සමනල කඳු පන්ති අතරය.

    (ii) පිදුරුතලාගල හා නමුණුකුල කඳු පන්ති අතරය.

    (iii) නකල්ස් හා පිදුරුතලාගල කඳු පන්ති අතරය.

    (iv) සමනල හා නකල්ස් කඳු පන්ති අතරය.

❖ අංක 11-15 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

11. සම්පත් පරිහරණයේ දී ප්‍රාථමික කටයුතුවලට වැඩි අවධානයක් යෙදීම ............................................ ජනාවාසයක විශේෂ ලක්ෂණයකි.

12. කිසියම් රටක නිශ්චිත කාල සීමාවක් තුළ ජාතික ආදායමෙන් එක් පුද්ගලයෙකුට අයත් වන කොටස ....................................................... ලෙස හඳුන්වයි.

13. කිවුල් දියට අනුවර්තනය වූ ජලයෙන් ඉහලට මුල් විහිදී ගිය ශාක ................................................ ලෙස හඳුන්වයි.

14. උස් කඳු අතර පිහිටි පහත් බිම් .............................................. ලෙස හඳුන්වයි.

15. මිහින්තලය ශ්‍රී ලංකාවේ ............................................... තැනිතලාව තුළ පිහිටා ඇති ශේෂ කන්දකි.

❖ අංක 16-20 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.

16. ජපානයෙහි කර්මාන්ත පවත්වාගෙන යනු ලබන්නේ සම්පූර්ණයෙන් ම ආනයනය කරන ලද අමුද්‍රව්‍ය වලිනි. (   )

17. රක්වාන කඳු මධ්‍යම කඳුකරයට සමාන්තර ව විහිදී ගිය හෙල් වැටියකි. (   )

18. භූමියේ උස වැඩි වන විට උෂ්ණත්වය වැඩිවීම පතන සීඝ්‍රතාවය ලෙස හඳුන්වයි. (   )

19. කඳුකර කලාපය තුළ භූගත ජලය සහ රතුපස ප්‍රයෝජනයට ගනිමින් කෘෂි කර්මාන්තය සිදු කරයි. (   )

20. ශ්‍රී ලංකාවේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන මාලිබොඩ පිහිටා ඇත්තේ කඳුකර තෙත් කලාපය තුළ ය. (   )

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!





agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි - 9 ශ්‍රේණිය


කාලය : පැය 2
Time : 2 hours

## GEOGRAPHY - II
භූගෝල විද්‍යාව – II

Name :- ................................................... Grade : -................ Index number:-....................

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- (ලකුණු 12 × 5 = 60 යි.)

1. (A) සපයා ඇති ආදර්ශ ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) "A" අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?

(ii) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1250*mm*-2000*mm* අතර පවතින කලාපය දක්වා ඇති අක්ෂරය කුමක් ද?

(iii) පේදුරු තුඩුව දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(iv) ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයට අයත් "B" අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක් ද?

(v) ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය අතින් දෙවැනි ස්ථානය ගන්නා දිස්ත්‍රික්කය දක්වා ඇති අක්ෂරය කුමක් ද?

(vi) "D" අක්ෂරයෙන් දක්වා ඇති ප්‍රදේශයට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රමය කුමක් ද?




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(B) සපයා ඇති ආදර්ශ ලෝක සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) "A" අක්ෂරයෙන් දැක්වෙන ආසියාවේ ප්‍රධාන කෘෂි කාර්මික රට කුමක් ද?

(ii) හොවැංහෝ ගංගාව දක්වා ඇති අක්ෂරය කුමක් ද?

(iiii) "B" අක්ෂරයෙන් දක්වා ඇති මුහුද කුමක් ද?

(iv) ගෝබි කාන්තාරය දක්වා ඇති අක්ෂරය කුමක් ද?

(v) "C" අක්ෂරයෙන් දක්වා ඇති දේශගුණික කලාපය තුළ ව්‍යාප්තව ඇති වනාන්තර වර්ගය කුමක් ද?

(vi) පැසිපික් සාගරය දක්වා ඇත්තේ කුමන අක්ෂරය මඟින් ද?

2. (i) පාකිස්ථානයේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(ii) ජපානයේ මෝටර් රථ ලෝකයේ ඉදිරියෙන් ම සිටීමට බලපා ඇති හේතු 04 ක් ලියන්න. *(ලකුණු 04 යි.)*

(iii) (a) ඩුබායි රට විසින් ලොව අනෙකුත් රටවල් සඳහා පවත්වාගෙන යනු ලබන සේවාවන් 03 ක් ලියන්න.

(b) ඉන් එක් සේවාවක ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 02 යි.)*



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

3. (i) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම 03 මොනවාද? *(ලකුණු 03 යි.)*

(ii) ශ්‍රී ලංකාව තුළ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම්වලට බලපාන සාධක 04 ක් ලියන්න. *(ලකුණු 04 යි.)*

(iii) (a) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය ආශ්‍රිතව ඇති වන ආපදා 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(b) ඉන් එක් ආපදාවක් ඇතිවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි.)*

4. (i) රටක ජන සංඛ්‍යාව වර්ධනය වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(ii) බස්නාහිර පළාත තුළ අධික ජන සංඛ්‍යාවක් ඇතිවීමට බලපාන හේතු 04 ක් ලියන්න. *(ලකුණු 04 යි.)*

(iii) (a) නාගරික ජනාවාස ආශ්‍රිත ව ඇති වන ගැටලු 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(b) ඉන් එක් ගැටලුවක් විසඳා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි.)*

5. (i) ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත ප්‍රදේශය තුළ දැකිය හැකි භූ විෂමතා ලක්ෂණ 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(ii) දී ඇති රූප සටහනෙහි A, B, C, D යනුවෙන් දක්වා ඇති කඳු පන්ති නම් කරන්න. *(ලකුණු 04 යි.)*



(iii) (a) ශ්‍රී ලංකාවේ කඳුකර කලාපය ආශ්‍රිත ව ඇති විය හැකි ආපදා 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(b) ඉන් එක් ආපදාවක් අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි.)*



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

6. (i) ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපීය වනාන්තර ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ 03 ක් නම් කරන්න. *(ලකුණු 03 යි.)*

(ii) දී ඇති තොරතුරු අනුව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| දේශගුණික කලාප | වාර්ෂික වර්ෂාපතනය | වර්ෂා පතන ක්‍රම |
|---|---|---|
| (a) කඳුකර වියළි කලාපය | (i) | (iii) |
| (b) අර්ධ ශුෂ්ක කලාපය | (ii) | (iv) |

*(ලකුණු 04 යි.)*

(iii) (a) වන වැස්ම විනාශ වීම නිසා සිදුවිය හැකි අයහපත් ප්‍රතිවිපාත 03 ක් ලියන්න *(ලකුණු 03 යි.)*

(b) ඉහත සඳහන් කළ ප්‍රතිවිපාක අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 02 ක් යෝජනා කරන්න. *(ලකුණු 02 යි.)*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk